# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අන්තරායකර සත්ත්ව (සංශෝධන)

**(49 වන අධිකාරය වූ) අන්තරායකර සත්ත්ව ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 29 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජුනි මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[140 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' ලෙස හඳුන්වනු ලබන) (49 වන අධිකාරය වූ) අන්තරායකර සත්ත්ව ආඥාපනතේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් ඇපකරය, රුපියල් දෙලක්ෂ පනස් දහස දක්වා වැඩි කරනු ලැබේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් අන්තරායකර සත්ත්වයකු විනාශ කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය නිශ්චිත ව දක්වනු ලැබේ.

එල්.ඩී.— ඕ. 47/2021

**(49 වන අධිකාරය වූ) අන්තරායකර සත්ත්ව ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2022 අංක    දරන අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (49 වන අධිකාරය වූ) අන්තරායකර සත්ත්ව ආඥාපනතේ 7 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ "රුපියල් දහසක්" යන වචන වෙනුවට "රුපියල් දෙලක්ෂ පනස්දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 49 වන අධිකාරයේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ "අධිකරණය එම ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනු ඇත." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

> "අධිකරණය එම ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනු ඇත:
>
> එසේ වුව ද, ලියාපදිංචි පශු වෛද්‍යවරයකු හෝ ලියාපදිංචි පශු වෛද්‍ය වෘත්තිකයකු හෝ 1956 අංක 46 දරන පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික පනතේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වෙනත් යම් තැනැත්තකු විසින් එම සත්ත්වයාට වේදනාවක් හෝ විඳවීමක් රහිතව මානුෂීය ආකාරයකට පමණක් එම සත්ත්වයා විනාශ කිරීම සිදු කළ යුතු ය.".

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව